# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 625/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 11/04/2024 පැය 1325

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරිම.**

**01.** **2024.04.11 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 02 | 30 | 140 | තඹ දඟර 01<br>යකඩ බැරල් 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථාන වෙත ඉදිරිපත් කර ඇත.

**02.** **ටී-56 වර්ගයේ ගිනි අවියක් සහ එම අවියට යොදන ජීව උණ්ඩ සමඟ සැකකරුවන් 03 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසය.**

**2024.04.10 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුද්ධි කොට්ඨාසයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මරදාන පොලිස් වසමේ ලොක්ගෙට්ලේන් ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර ටී 56 වර්ගයේ ගිනි අවියක් , එම ගිනි අවියට යොදන ජීව උණ්ඩ 14ක්, කඩු 01 සහ කිනිසි 01 ක් සමඟ සැකකරුවන් 03 දෙනෙකු අත්අඩංගුවට ගෙන මරදාන පොලිස් ස්ථානයට භාරදී ඇත.**

**අත්අඩංගුවට ගත් සැකකරුවන් වයස අවුරුදු 18ත් 47ත් අතර වයස් වල පසු වන කොළඹ 10 ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.**

**මරදාන පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**03.** **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුර.**

**2024.04.10 වන දින උදෑසන  කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා පුල්මුඩේ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත තිරියාය පොලිස් වසමේ කලම්පත්තුව ප්‍රදේශයේ වැටලීමක් සිදුකර මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමග සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන කුච්චවේලි  පොලිස් ස්ථානයට භාරදී ඇත.**

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48ක් වන කුච්චවේලි ප්‍රදේශයේ පදිංචිකරුවකු වේ.**

**කුච්චවේලි පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.**

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍යය කොට්ඨාසය.**